සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2015

මගේ අංකය: NP/10/03/COM/CIR/2015

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත් සභාව,

2015.04.29

උතුරු පළාතේ සියළුම සමූපකාර සමිතිවල සහ

සංගම්වල සභාපතිවරුන් වෙත.

**<u>පරීක්ෂණ නිලධාරීන්ගේ ගමන් ගාස්තු</u>**

සමූපකාර සමිතිවල විනය පරීක්ෂණ, අභියාචනා සම්බන්ධව පරීක්ෂණ පවත්වන විට පරීක්ෂණ නිලධාරීන් වශයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ ගමන් ගාස්තු, ඒකාබද්ධ දීමනා, විශේෂ ගමන් වියදම් වැනි දීමනා ගෙවීමේදී පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ගෙවීම උතුරු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

01. මෙම ගමන් ගාස්තු පහත සඳහන් අවශ්‍යතාවන් සඳහා පමණක් අදාල වේ. අදාල නිලධාරියා තමන්ගේ පදිංචි ස්ථානයේ හෝ සේවා ස්ථානයේ (ආසන්න දුර ප්‍රමාණය කුමක් වේද එය) සිට විභාගය පවත්වන ස්ථානය සඳහා වූ දුර සහ තම පදිංචි ස්ථානයට ලඟාවිය හැකි දුර (එවැනිම දුර) කිලෝ මීටර් 11.2 කට වැඩිවුවහොත් මිස දීමනා කිසිවක් නොගෙවිය යුතුය.

02. මෙම ගමන් ගාස්තු පරීක්ෂණ නිලධාරීන් දැනට ලබන වැටුප හෝ ඔවුන් විශ්‍රාම ලබා ඇත්නම් විශ්‍රාම ලබන විට අවසානයට ලැබූ වැටුප ආදියෙන් පහත සඳහන් අයුරින් ගණනය කල යුතුය.

| <u>වැටුප් ප්‍රමාණය</u> | <u>ඒකාබද්ධ දීමනා</u> |
|---|---|
| රු: 15839/- ට අඩු මාසික වැටුප | රු: 350.00 |
| රු: 15840/- සිට 21044/- දක්වාවූ මාසික වැටුප | රු: 400.00 |
| රු: 21645/- ට වැඩි මාසික වැටුප | රු: 500.00 |

03. අදාල රාජකාරිය සඳහා ගමන් කරන කාලය ඇතුළුව පැය 6 සිට පැය 12 දක්වා ගතවුවහොත් ඒකාබද්ධ දීමනාවෙන් අඩක්ද පැය 12 සිට 24 දක්වා වූ කාලය නම් සම්පූර්ණ මුදලද, පැය 24 ට වැඩි වන්නේ නම් ඒකාබද්ධ දීමනාව සමග අදාල වන ඒකාබද්ධ දීමනාවේ 25% ක්ද විශේෂ දීමනා වශයෙන් ගෙවිය යුතුය.

04. මෙම පරීක්ෂණ නිලධාරීන් ගමන් ගාස්තු ලබා ගැනීමේ හිමිකම් ලත් අයවේ. මේ සඳහා ඉතා අඩු ගමන් ගාස්තු අයකරන ගමන් මාර්ගය තෝරා ගන්නා අතර ගාස්තු ගෙවන ලද බවට කුවිතාන්සියක්ද ඉදිරිපත් කල යුතුය.

05. විනය පරීක්ෂණය හා අභියාචනා විභාගය සම්බන්ධව මෙම ගමන් ගාස්තු ගෙවීම් පිළිවෙලින් සමිති විසින් සහ කොමිෂන් සභා කාර්‍යාලය විසින් ගෙවනු ලැබේ.

2015.04.28 දිනැති කොමිෂන් සභාවේ තීරණය පරිදි.

අත්සන

පී. වාකීසන්, P.VAGESHAN
Secretary

ලේකම්. Co-operative Employees Commission
Northern Provincial Council

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත.